# මගේ ලෝකය

ඇසෙන දැනෙන දේ..... හිතට වැදෙන දේ.....

ජගත් ජේ එදිරිසිංහ



'මේසය මත කඩදාසි දැම්මෙන් වළකින්න'

පසුගිය දිනෙක මේ දැන්වීම තිබුණේ මගේ මේසය මත ය. මා නොමැති දිනෙක මගේ මේසය පිළිවෙළක් කළ රණසිංහ සොහොයුරා ගේ මේ දැන්වීම මට ය. කඩදාසි වලට මා මේ තරම් ආදරය කරන්නේ මන්දැයි මගේ හිතවතුන් කල්පනා කරන බව මම දනිමි.

''නඹේ මතක රේඩියෝ යා හැකි උපරිම අතීතයට ගිය විට කුඩා දරුවකු ලෙස නුඹට සිහිපත් වන්නේ කුමක්ද?'' මේ අපූරු ප්‍රශ්නය නැගුවේ ඉංගිරිසිය මුවහත් කරගන්නට කොල්ලුපිටියේ බ්‍රිතාන්‍ය කවුන්සිලයට යමින් සිටි යුගයේ මට ඉගැන්වූ අසාමාන්‍ය ලෙස දිගු නැහැයක් තිබූ සුදු ජාතික සුවතියයි. (''මම මගේ තාත්තාගේම දුවක බව මට සියයට සියයක්ම විශ්වාස ය ලබා දෙන්නේ මගේ මේ දිග නාසයයි. මගේ තාත්තාට තිබෙන්නේත් මේ නහයමයි'' පන්තිය සිනා ගස්වමින් වරෙක ඈ කිවා ය.)

මගේ ගුරුවරියගේ ප්‍රශ්නය ගැන මම සිතන්නට පටන් ගත්තෙමි. ඒ සිතුවිල්ල මගේ මුවගට සිනාවක් නංවයි.

''ඇයි හිනාවෙන්නෙ?'' ගුරුවරිය අසයි.

''මට මතක තිබෙන එකම දේ මං කඩදාසි ගොඩක් වටකරගෙන ලියමින් හිටිය බව පමණයි'' මම කියමි.

''මොනාද ලිව්වෙ?''

''කවි.. කෙටිකතා.. තවත් බොහෝ දේ..''

මගේ සුදු ජාතික ගුරුවරිය නළල රැළි නංවාගනිමින් මා දෙස බලා සිටියා ය. ''මගේ මතකය'' මැයෙන් රචනාවක් ලියන්නැයි ඇය අපට පැවරුවාය. එදින ඇගේ පාඩම අවසන අපි ලියූ රචනා සියල්ල ඇය එකතු කර ගත්තා ය.

ඇය පසු දා පන්තිය පැමිණියේ රතු කරගත් ඇස් වළින් යුතුව ය.

''හැමෝම ඉතා හොඳින් රචනාව ලියා තියෙනවා. ඒත් මෙයින් එක් රචනාවක් ඊයේ මුලු රැයත් අද දවසත් මගේ ඇස් කඳුළින් තෙත් කළා. ඒ රචනාව පන්තියට ඇහෙන්න කියවන්න මං කැමතියි.'' ඈ මා දෙස බැලුවා ය. ''ජගත්. උඹේ රචනය පන්තියට කියවනවාට අකැමැත්තක් නැහැ නේද?''

මම හිස වනා නැතැයි කීවෙමි. ඇය බොහෝ හැඟුම් බරව මගේ රචනය කියෙව්වා ය.

මගේ ඉංගිරිසි රචනයේ අදහස සංක්ෂිප්තව සිංහලෙන් ලියන්නට මම උත්සාහ ගන්නෙමි.

''එක්තරා සුන්දර සැන්දෑවක මගේ තාත්තා මා ඔහු ළඟින් වාඩි කරවා ගෙන මගේ ජීවිතයේ ඔහු මට කියා දුන් එකම කතාව කී සැටි මට මතක ය. සය වතාවක් යුද්දයෙන් පැරදී පළා ගොස් සත්වැනි වතාවටත් උත්සාහ කර ජයගත් සෙනෙවියා ගැන වූ ඒ කතාව මගේ ජීවිතයේ ආදර්ශ පාඨය සේ විය. මම බොහෝ වාර ගණනක් පැරදුනෙමි. එහෙත් නැවත නැගී සිටින්නට ඒ කතාව මගේ පිහිටට සිටියේ ය. අතිශය වෙහෙසකර අධ්‍යාපනයකින් පසු ඉංජිනේරුවකු ලෙස පත්වීම බාරගත් දා පළමු වතාවට මගේ තාත්තාගේ ඇස් කඳුළින් පිරී දිළිසෙණු මම දුටුවෙමි''

මේ රචනය පිටු කීපයක් පුරා සංවේදී ලෙස ඉංගිරිසියෙන් ලියන්නට මා ගත් උත්සාහය

***''එක්තරා සුන්දර සැන්දෑවක මගේ තාත්තා මා ඔහු ළඟින් වාඩි කරවා ගෙන මගේ ජීවිතයේ ඔහු මට කියා දුන් එකම කතාව කී සැටි මට මතක ය. සය වතාවක් යුද්දයෙන් පැරදී පළා ගොස් සත්වැනි වතාවටත් උත්සාහ කර ජයගත් සෙනෙවියා ගැන වූ ඒ කතාව මගේ ජීවිතයේ ආදර්ශ පාඨය සේ විය. මම බොහෝ වාර ගණනක් පැරදුනෙමි. එහෙත් නැවත නැගී සිටින්නට ඒ කතාව මගේ පිහිටට සිටියේ ය. අතිශය වෙහෙසකර අධ්‍යාපනයකින් පසු ඉංජිනේරුවකු ලෙස පත්වීම බාරගත් දා පළමු වතාවට මගේ තාත්තාගේ ඇස් කඳුළින් පිරී දිළිසෙණු මම දුටුවෙමි''***

සාර්ථක වී තිබෙනු මට පෙණෙයි.

''සිහිපත් කළ හැකි පුංචි කාලයේදී උඹ කළ එකම දෙය කඩදාසි ගොඩක් වට කොට ගෙන ලියමින් සිටි එකයි කියා කියූ කියමන දැන් මං පිළිගන්නවා'' පන්තිය අවසන පිටවී යන්නට පෙර මගේ ගුරුවරිය මා අසළට පැමිණ කිවා ය.

සම වයසේ ළමුන්ගෙන් වෙන්ව මගේ හුදකලා


1973 මාර්තු 19
රූපරේඛා

ආසයි මට

ලෝකයට වී ලියමින් සිටි හැටි මට අදටත් සිහිපත් කළ හැකි ය. මම අතිශය කුලෑටි දරුවකු වූයෙමි. එබැවින් ලියූ සියල්ල කිසිවකුට නොපෙනෙන සේ සඟවා තබන්නට ද නිතරම වෙහෙසුණෙමි.

පළමු වතාවට මගේ කවියක් පුවත් පතක පළ වන්නේ 1973 දී ය. ඒ රූපරේඛා නමින් ටයිම්ස් ආයතනය මුද්‍රණය කළ ලංකාවේ පළමු චිත්‍රකතා පත්තරයේ ළපටි පෙළ අතිරේකයේ ය.

(ළපටි පෙළ ළමා අතිරේකය මුළින් ආවේ ටයිම්ස් ආයතනයේ වනිතා විත්ති කාන්තා පුවත් පත සමගින් ය. වනිතා විත්තිය වැඩිහිටියන්ට වඩා සුදුසු ලිපි පළකිරීම ඇරඹූ වකවානුවේ දොරට වැඩි රූප රේඛා පුවත් පතට ළපටි පෙළ අතිරේකය මාරු කෙරුණේ ළපැටියන්ගේ සුබ සිද්ධිය සඳහාම විය යුතු ය. වඩා සිත් ඇද ගන්නා නිමාවකින් යුතුව ලේඛ්හවුසියේ සතුට චිත්‍රකතා පුවත්පත ආරම්භ වීමත් සමගින් ම වාගේ රූපරේඛා පුවත් පත නැවතුණ බව මතක ය)

ළපටි පෙළ සංස්කාරකවරයාට අදත් කෘතඥවන්නේ මේ කුඩා කවිය මගේ ගමන ආරම්භ කළ කඩ ඉම බවට පත් කළේ ඔහු බැවින් ය.

එතැන් සිට මම මහත් වේගයකින් ලියන්නට පටන් ගත්තෙමි. මගේ නිර්මාණ සඳහා ඉඩක් ලබා ගත හැකි සෑම පුවත්පතකටම ලිව්වෙමි. මගේ පියාට අයත් වෙළඳ සලක් තිබූ බැවින් සතියේ සියලුම පුවත්පත් කියවන්නට අපට ඉඩ ලැබීම මහත් වරප්‍රසාදයක් විය. එනිසා ළමා නිර්මාණ සඳහා ඉඩක් ලබා දෙන සෑම පුවත්පතකටම මම ලිව්වෙමි. මිහිර ටිකිරි රූපරේඛා නුවන නවයුගය පමණක් නොව ජනසතිය වැනි දේශපාලන පුවත්පත් වලටද ලිපි ලියා යැව්වෙමි. මිහිර පුවත්පතට කාලයක් 'පැංචා' නමින් කාටූනයක් ද ඇන්දෙමි.

නව වන ශ්‍රේණියේ දී ජනසතිය පුවත්පතේ ළමා පිටුවට මා ලියා යැවූ 'පිය සෙනෙහස' නම් වූ කෙටි කතාව ඒ සතියේ එම පුවත්පතේ ප්‍රධාන කෙටිකතාව ලෙස පළකිරීම මගේ ගමනේ තවත් පියවරක් විය. මගේ නිර්මාණ පිළිබඳව මා ලද පළමු තක්සේරුව එය විය.

මගේ නිර්මාණ සඳහා කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයය මට තෝතැන්නක් විය. පාසල තුළ මට සුවිශේෂ පිළිගැනීමක් නිර්මාණය වී තිබුණි. මගේ ලිපි කියවා දිවයිනේ නන් දෙසින් රසික රසිකාවියන් එවූ ලියුම් මිටියක් මා නමින් සෑම සතියකම පාසලට ලැබෙමින් තිබුණි. පාසලේ ලිපිනයට සිසුවකුට ලිපියක් ලැබුණ විට නියෝජ්‍ය විදුහල්පති තුමා විසින් ඒ ලිපිය විවෘත කර කියවා බලනු ලැබීම පාසලේ සම්ප්‍රදාය විය. ඒ සම්ප්‍රදාය මට අදාල නොවිය. මගේ ලියුම් මිටිය පාසලේ කාර්යාල කාර්ය සහායක සේපාල අත මගේ පන්තියටම එවනු ලැබුණේ කිසිදු විවෘත කිරීමකින් තොරව ය.

මගේ නිර්මාණ පොතක් සේ එළි දක්වන්නට තවත් උත්සාහයක් මව්සින් ගන්නා ලද්දේ මා උසස් පෙළ පන්තියේ ඉගෙනුම ලබමින් සිටිය දීය. මේ වතාවේදී මට උත්තේජනය සැපයුවේ මාතර සුජාතා බාලිකාවේ සිසුවියක වූ ඉන්ද්‍රා පුෂ්පානි ජයවර්ධන විසින් ලියා ප්‍රදීප ප්‍රකාශකයින් විසින් ප්‍රකාශයට පත් කරන ලද නිර්මාණ එකතුවකි. පොතේ නම 'අණබෙර ගසා කියන වගයි' විය.

සුජාතා බාලිකාවේ සිසුවියකට නිර්මාණ එකතුවක් එළි දක්වන්නට හැකි නම් මට නොහැකි වන්නේ කෙසේ ද? මගේ නිර්මාණ එකතුවක් එළි දක්වන්නට අනුග්‍රහය ලබා දෙන්නැයි ඉල්ලා මම ප්‍රදීප ප්‍රකාශකයනට ලිපියක් ලියා යැව්වෙමි.

The best way to make your dreams come true is to wake up.
Paul Valery

ප්‍රදීප ප්‍රකාශකයෝ හැරෙන තැපෑලෙන් ලිපියක් එවූ හ.

''අප ආධුනිකයන්ගේ නිර්මාණ පළකිරීමට බාරගන්නේ නැත''

ඉන්ද්‍රා පුෂ්පානි ජයවර්ධන බොහෝ කාලයක් නිහඬව සිටිමෙන් පසු වසර 2000 දී පමණ නන්දා මාලිනියගේ අරලිය ලන්දට කැසට් පටය සඳහා ගීතයක් ලියා තිබෙණු මම දුටුවෙමි. ඒ කැසට් පටයේ ඇගේ ලිපිනය ද විය. 2000 වසරේදී මගේ 'කන්ද උඩ මාළිග ාව' කෙටි කතා සංග්‍රහය නිකුත් කෙරුණු පසු ඇය සම්බන්ධ ඒ අතීත සිදුවීම සිහිපත් කරමින් මම ඇයට පොතේ පිටපතක් තැපැල් කර යැව්වෙමි. ''දයාබර ජගත් මල්ලි'' යි ආමන්ත්‍රණය කරමින් ඈ මට එවූ පිළිතුර තුළ රැඳී තිබුණේ නිර්මාණකාරියක ලෙස ගමනක් අරඹා නිහඬව සිටින්නට සිදුවීම පිළිබඳ දුක්බර කතාවයි.

මම ද මගේ ජීවිතයේ 1986 වසරෙන් ඇරඹී අවුරුදු දහයක කාල පරිච්ඡේදය තුළ කිසිවක් නොලියා සිටියෙමි. එසේ විය හැකි ද එසේ වූයේ ඇයි ද යන පැන වලට බොහෝ පිළිතුරු තිබිය හැකි ය. එසේ සිදු වූ බව පමණක් සටහන් කර තබමි.

අවුරුදු දහයකට පසු කවියක් ලිවේ ඔස්ට්‍රේලියාවේ දී ය. 'අප බොහෝ ඈතයි' නම් වූ එය එවකට රත්න ශ්‍රී විජේසිංහ කවියා විසින් සංස්කරණය කරණු ලැබූ රාවයේ 'පද්ම තටාකය' කවි පිටුවට යැව්වෙමි. ඒ කවිය ඒ සතියේ 'රන් නෙළුම' ලෙස තෝරාගෙන අගැයීමට ලක් වීම මට මහත් ධෛර්යයක් විය.

අප බොහෝ ඈතයි

සිත කළඹාය තරු රැස සේම දස අතේ
පිණි විසිරේය තරු ඉකි බිඳින යාමයේ
නිම නොකළා නමුදු ගණ අඳුර ජීවිතේ
සඳ පිපුනාය මෙල්බන් නුවර ආකහේ

නිමන්නට සෙනෙහෙ පොදි බැඳුන නුඹ වෙතේ
පවන් පොදැට නොහැකිය නුහුරු නගරයේ
ලියන්නට කවක් හැකි වේද සඳ මතේ
දකින්නට නුඹට හෙට කොළඹ ආකහේ

වැටෙන පිණි හඬට ළතැවෙනා හිත යොමා
නිතින ගිල ගනිමි සෝ සුසුම රහසිනා
ගිමන දිවි ගමන නිමවනා දින ගෙවා
පවන සේ හමමි සෙනෙහෙනා ඔබ සොයා

දැන් මම නැවත ලියමි. එය නවත්වන්නට නොහැකි තරමට මම එයට ඇබ්බැහි වී සිටින්නෙමි. උදෑසන වැඩ අරඹන මොහොතේ සිට මැදියම් රැයේ නින්දට යන තෙක් මම පරිගණකය මත ලියැවෙන සිංහල අකුරු අතරේ අතරමංවේ සිටින්නෙමි.

වෙනදා සේ ම දැන් ද මගේ මේසය මත කඩදාසි පිරෙයි. මගේ නිර්මාණ සේ ම ඔබේ නිර්මාණ ද ඒ අතර ඇත. මගේ ලෝකයේ කොටසක් පිරෙන්නේ ඒ සියළු නිර්මාණ වලින් ය.

STANHOPE PRINTING
FOR OFFSET AND DIGITAL PRINTING
සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කඳිම ආවස්ථාවක්
ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සඳහන් අංකයනට අමතන්න
- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posters
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists

ALL YOUR PRINTING NEEDS....
මුද්‍රණ ඇනවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත
LAKSHMAN
TEL.(02) 9626 7660
MOB.0405287243